# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2394/52 - 2024 ජූලි මස 26 වැනි සිකුරාදා - 2024.07.26**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**ජනාධිපතිවරණය - 2024**

1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම පිළිබඳ පනත

8 වන වගන්තිය යටතේ දැනුම්දීමයි

1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ පනතේ 2 වගන්තිය යටතේ නියමය පළ කරන ලද දිනය වූ 2024.07.26 දිනයත් නාමයෝජනා කිරීමේ දිනය වූ 2024.08.15 දිනයට පෙර දිනය වූ 2024.08.14 දින මධ්‍යාහ්න දොළහට පෙර හෝ අතර වූ කාලය තුළ කාර්යාල දිනවල දී (සෙනසුරාදා හා ඉරිදා හැර) පෙ.ව. 8.30 සිට ප.ව. 4.15 දක්වා ද 2024.08.14 වන දිනයේ දී පමණක් පෙ.ව. 8.30 සිට මධ්‍යාහ්න 12.00 දක්වා ජනාධිපතිවරණය සඳහා අපේක්ෂකයෙකු විසින් හෝ අපේක්ෂකයෙකු වෙනුවෙන් යම් තැනැත්තෙකු විසින්,

(අ) ඒ අපේක්ෂකයා පිළිගත් දේශපාලන පක්ෂයක් විසින් නාමයෝජනා කරන ලද අපේක්ෂකයෙකු වන අවස්ථාවක, වලංගු මුදලින් රුපියල් පනස් දහසක් වූ මුදලක් ද ;

(ආ) ඒ අපේක්ෂකයා වෙනත් යම් දේශපාලන පක්ෂයක් විසින් හෝ ඡන්ද හිමියෙකු විසින් හෝ නාමයෝජනා කරන ලද අපේක්ෂකයෙකු වන අවස්ථාවක වලංගු මුදලින් රුපියල් හැත්තෑපන්දහසක් වූ මුදලක් ද ;

මැතිවරණ කොමිෂන් සභාව වෙත හෝ තත්කාර්යය සඳහා මැතිවරණ කොමිෂන් සභාව විසින් බලය පවරන ලද යම් තැනැත්තෙකු වෙත හෝ රාජගිරිය, සරණ මාවතේ පිහිටි මැතිවරණ කොමිෂන් සභා කාර්යාලයේ දී ඇප වශයෙන් තැන්පත් කළ යුතු බව ; නැතහොත් ඇප වශයෙන් තැන්පත් කිරීමට සැලැස්විය යුතු බව ; 1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම පිළිබඳ පනතේ 8 වන වගන්තිය අනුව දැනුම් දෙනු ලැබේ.

ආර්. එම්. ඒ. එල්. රත්නායක,
සභාපති,
මැතිවරණ කොමිෂන් සභාව.

එම්. ඒ. පී. සී. පෙරේරා,
සාමාජික,
මැතිවරණ කොමිෂන් සභාව.

අමීර් ෆායිස්,
සාමාජික,
මැතිවරණ කොමිෂන් සභාව.

ඒ. ෂන්මුගනාදන්,
සාමාජික,
මැතිවරණ කොමිෂන් සභාව.

මහාචාර්ය ලක්ෂ්මන් දිසානායක,
සාමාජික,
මැතිවරණ කොමිෂන් සභාව.

2024 ජූලි මස 26 වැනි දින,
මැතිවරණ කොමිෂන් සභාව,
මැතිවරණ කොමිෂන් සභා කාර්යාලය,
සරණ මාවත, රාජගිරිය.

1A - G 42318 — 604 (2024/07)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.